# හරි
# කීකරු
# චූටි කිටී



**සෙනායා මිහිදුලි ශ්‍රී වික්‍රම**

**2 ශ්‍රේණිය D**

**මහමායා බාලිකා විදුහල**

# හරි කීකරු චූටි කිටී

සෙනායා මිහිදුලි ශ්‍රී වික්‍රම

# හරි කීකරු චූටි කිටී

කතෘ ප්‍රකාශනයකි
පළමු මුද්‍රණය 2025 පෙබරවාරි

කතාව හා චිත්‍ර - සෙනායා මිහිදුලි ශ්‍රී වික්‍රම
2 ශ්‍රේණිය D
මහමායා බාලිකා විදුහල,
මහනුවර

ISBN 9786242086040

# පිදුම

පුංචි මල් කැකුළුවැනි අප හට
යහගුණාදම් කියාදෙමින්
නිසි මග පෙන්වන
ආදරණීය
**ගයාත්‍රි ගුරුමෑණියනී**
ඔබ වෙත
පිළිගන්වමි බැතියෙනි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එදා වැසි දිනයක් මම තාත්තා එනතුරු මග බලාගෙන සිටියා.

ටික වෙලාවකින් තාත්තා ඈතින් එනවා මම දැක්කා.

අනේ........... තාත්තාගේ අතේ ලස්සන පූස් පැටියෙක්.



මෙයා පාරෙ තෙමි තෙමී හිටියා.

මම ඉතින් ගෙදර ගෙනාවා. තාත්තා කිවුවා.

මෙයා පවි තාත්තේ........... හොඳටම තෙමිලා.

අපි රෙදි කෑල්ලක් අරගෙන පූස් පැටියා හොඳින් පිස දැමුවා.

අම්මා කිරි හදාගෙන ඇවිත් එයාට බොන්න දුන්නා.

චූටි පැටියා කිරි ටික ඔක්කොම බිව්වා.



පූස් පැටියා දැන් ටිකෙන් ටික ලොකු වෙනවා.

මම එයාට චූටි කියලා නමක් දැම්මා.

එයා ටික ටික අපේ ගෙදරට පුරුදු වුණා.

චූටි උදෙන්ම නැගිටිනවා. කොයි වෙලාවෙත් මගේ පස්සෙන්මයි.

මම පාසල් යනකොට ඣදාවි ඣදාවි කියනවා.



මම පාසල් ඇරිලා ගෙදර එනකොට චූටි දොර ළඟට වෙලා බලාගෙන ඉන්නවා.


ඒ වෙලාවේ සිට එය මගේ පස්සෙන්මයි එන්නේ.

මම එතකොට එයාට විස්කෝතු කන්න දෙනවා.

අපි දෙන්නා දැන් හොඳ යාළුවෝ.

එක දවසක් මම කාමරේ පාඩම් කරමින් ඉන්න විට චූටි මගෙ ළඟට පැන්නා.

**අයියෝ** ! එයාගේ කටේ ලේන් පැටියෙක්.



මම තාත්තාට කතා කළා.

තාත්තා ඉක්මනට ඇවිත් ලේන් පැටියාව බේර ගන්න හැදුවත් එයා මැරිලා.

අපිට හරි දුකයි.



චූටිත් බිම බලාගෙන දුකින් වගේ ඉන්නවා.

මම චූටි ළඟට ගිහින් එයාගේ ඔළුව අතගෑවා.

ඔයා ආයේ කවදාවත් මේ වගේ නරක වැඩ කරන්න එපා.

මම එහෙම කියන කොට චූටි ඤාව් කියලා මගේ කකුල ලෙව කෑවා.

මට චූටි ගැන දුක හිතුනා.



එන්න චූටි අපි සෙල්ලම් කරමු.


අපි එදා ගොඩ වෙලා සෙල්ලම් කලා.















# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්